／ 
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2302/22 - 2022 ඔක්තෝබර් මස 19 වැනි බදාදා - 2022.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.: තිප්‍රාලේ/1/8/3/55 අත්.*
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.: 4-3/11/2015/යූඩීඒ/227.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

ආරාමය පෙදෙසේ වරිපනම් අංක 181 දරන ඉඩමෙන් කොටසක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත අත්කර ගැනීම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (කොට්ඨාස අංක 29, දෙමටගොඩ, කොළඹ මහ නගර සභා සීමාව තුළ) දෙමටගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මූ.පි.කො. 9859 හා 2022.07.11 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0600 ක් පමණ වූ ඉඩම් කැබැල්ලේ විස්තර පහත පරිදි වේ.

1. කැබලි අංක 1

ඉඩමේ නම: වරිපනම් අංක 181 (කොටසක්) ආරාමය පෙදෙස; විස්තරය: ගෙවත්ත මහල් නිවාසයක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0600.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 නොවැම්බර් මස 30 වැනි දින පෙ. ව. 10.00ට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2022 නොවැම්බර් මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ප්‍රියන්තා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

2022 ඔක්තෝබර් මස 18 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0174

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: තිප්‍රාලේ/1/8/3/56 අත්.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4-3/11/2015/යූඩීඒ/228.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

ආරාමය පෙදෙසේ වරිපනම් අංක 161 දරන ඉඩමෙන් කොටසක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත අත්කර ගැනීම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙමටගොඩ (කොට්ඨාස අංක 29, කොළඹ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.කො. 9860 හා 2022.07.06 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 හා 2 වශයෙන් පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0346 ක් පමණ වූ ඉඩම් කැබැල්ලේ විස්තර පහත පරිදි වේ.

1. **කැබලි අංක 1**

ඉඩමේ නම: -; විස්තරය: සිමෙන්ති කාණුව; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0012.

2. **කැබලි අංක 2**

ඉඩමේ නම: වරිපනම් අංක 161 ආරාමය පෙදෙස; විස්තරය: ගෙවත්ත තාවකාලික ගොඩනැගිල්ලක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0334.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 නොවැම්බර් මස 30 වැනි දින පෙ. ව. 10.00ට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2022 නොවැම්බර් මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ප්‍රියන්තා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

2022 ඔක්තෝබර් මස 18 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0175